# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2241/7 - 2021 අගෝස්තු මස 16 වැනි සඳුදා - 2021.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් 44 (1), 45 (1) සහ 47 (1) (අ) (ආ) ව්‍යවස්ථාවන්ට අනුකූලව, මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2020 අගෝස්තු මස 09 දිනැති අංක 2187/27 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය, වරින් වර සංශෝධනය කරන ලදුව, 2021 අගෝස්තු මස 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2021 අගෝස්තු මස 16 වන දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ - 01.

(1) එම නිවේදනයේ "ජනාධිපති කාර්යාලය - ජාතික ප්‍රමුඛතා" ශීර්ෂය යටතේ වන "04. ආයතනික හා නෛතික රාමුව" සම්බන්ධයෙන් පහත පරිදි;

**04. ආයතනික හා නෛතික රාමුව**

| *ආයතන / අස්ථිත්වයන්* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>2. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව<br>3. ත්‍රිවිධ හමුදා සාමාජිකයින් කොරෝනා වෛරසය ආසාදනයෙන් වළක්වා ගැනීම සඳහා සෑම හමුදාවක් විසින්ම ගත යුතු ක්‍රියා මාර්ග අධ්‍යයනය කර එකී පියවර ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදීම පිණිස වන ජනාධිපති කාර්ය සාධක බලකාය | • මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (ආයෝජන මණ්ඩලය නීතිය) (1978 අංක 4)<br>• කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11) |

1A - G 34538 — 380 (2021/08)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *ආයතන / අස්ථිත්වයන්* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 4. සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>5. කොවිඩ් - 19 අමාත්‍යාංශ කාර්ය සාධක බලකාය<br>6. නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>7. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය<br>8. ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>9. දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත ශ්‍රී ලංකාවක් ඇතිකිරීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය<br>10. ජාතික සංවර්ධන ප්‍රමුඛතා සහ ස්වයං රැකියා හා පාරම්පරික වෘත්තීන්හි නියැලෙන කුඩා ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා වෙනුවෙන් භූ සම්පත් යොදා ගැනීම සහ ඒවා ලබා ගැනීමේ මූලාශ්‍ර හා ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>11. කොවිඩ් - 19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය | |

(2) එම නිවේදනයෙහි අංක "6.0 මුදල් අමාත්‍ය" ශීර්ෂය යටතේ වන "04. අදාළ ආයතනික හා නෛතික රාමුව" පහත පරිදි;

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. **භාණ්ඩාගාර කටයුතු**<br>i. මහා භාණ්ඩාගාරය<br>ii. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>iii. ජාතික අයවැය දෙපාර්තමේන්තුව<br>iv. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව<br>v. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව<br>vi. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව<br>vii. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව<br>viii. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව<br>ix. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>x. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>xi. නීති කටයුතු දෙපාර්තමේන්තුව<br>xii. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව<br>xiii. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | • විසර්ජන පනත්<br>• රේගු ආඥාපනත (1956 අංක 17)<br>• විදේශීය ණය පනත (1957 අංක 29)<br>• හර බදු පනත (2007 අංක 12)<br>• ඔට්ටු ඇල්ලීම් හා සූදු බදු පනත (1998 අංක 40)<br>• කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත (2010 අංක 17)<br>• ආර්ථික සේවා ගාස්තු පනත (2006 අංක 13)<br>• සුරාබදු ආඥාපනත (52 වැනි අධිකාරය)<br>• මූල්‍ය කල් බදු පනත (2000 අංක 56)<br>• මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත (2006 අංක 6)<br>• රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත (2003 අංක 3)<br>• දේශීය ආදායම් පනත (2017 අංක 24)<br>• රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (2000 අංක 43) |

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| **2. රාජ්‍ය ආදායම් කළමනාකරණ කටයුතු**<br><br>i. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව<br>ii. ශ්‍රී ලංකා රේගුව<br>iii. සුරාබදු දෙපාර්තමේන්තුව<br>iv. ජාතික ලොතරැයි මණ්ඩලය<br>v. සංවර්ධන ලොතරැයි මණ්ඩලය<br>vi. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව<br><br>**3. බැංකු මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපල ප්‍රතිපත්ති හා නියාමන කටයුතු**<br><br>i. ශ්‍රී ලංකා මහ බැංකුව<br>ii. සියලුම රාජ්‍ය බැංකු, මූල්‍ය, රක්ෂණ හා ඒවායේ පාලිත සමාගම් හා ආශ්‍රිත ආයතන<br>iii. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව<br>iv. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්<br>v. ණය තොරතුරු කාර්යංශය<br>vi. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>vii. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව<br>viii. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව<br><br>**4. අරමුදල් කළමනාකරණය**<br><br>i. ලෝහෝර් ආර්යා අරමුදල<br>ii. වර්ජන, කෝලහාල, සිවිල් කලබල හා ත්‍රස්තවාදය පිළිබඳ අරමුදල<br>iii. ජාතික රක්ෂණ භාර අරමුදල<br>iv. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල<br>v. ශ්‍රම වාසනා අරමුදල<br>vi. ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල<br>vii. වකුගඩු අරමුදල<br>viii. තේ ශක්ති අරමුදල<br>ix. කප්රුක අරමුදල<br>x. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල<br>xi. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල<br>xii. දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>xiii. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් පිළිබඳ අරමුදල<br>xiv. තුරුසවිය අරමුදල | • ලෝහෝර් ආර්යා අරමුදල පනත (1951 අංක 38)<br>• දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (1923 අංක 8)<br>• ජාතිය ගොඩනැගීමේ බදු පනත (2009 අංක 9)<br>• ව්‍යාපාර නාම පනත (1987 අංක 7)<br>• සමාගම් පනත (2007 අංක 7)<br>• වෙළඳ සළකුණු පනත (1964 අංක 30)<br>• සීට්ටු ආඥාපනත (1935 අංක 61)<br>• පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)<br>• මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (2006 අංක 5)<br>• ආනයන හා අපනයන (පාලන) පනත (1969 අංක 1)<br>• මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2006 අංක 12)<br>• මුද්දර ගාස්තු පනත (1982 අංක 43)<br>• එකතු කළ අගය මත බදු පනත (2002 අංක 14)<br>• මුදල් පනත (1971 අංක 38)<br>• පරිසර සංරක්ෂණ බදු පනත (2008 අංක 26)<br>• බදු අභියාචනා කොමිෂන් සභාව පනත (2008 අංක 23)<br>• සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත (1997 අංක 20)<br>• ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත (1978 අංක 15)<br>• මුදල් නීති පනත (1949 අංක 58)<br>• ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත (1971 අංක 30)<br>• මහජන බැංකු පනත (1961 අංක 29)<br>• ලංකා බැංකු ආඥාපනත (1938 අංක 53)<br>• බැංකු පනත (1988 අංක 30)<br>• බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනත (1990 අංක 4)<br>• ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත (1987 අංක 36)<br>• ජාතික රක්ෂණ භාර අරමුදල් පනත (2006 අංක 28)<br>• සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශෙෂ විධිවිධාන) පනත (1993 අංක 19)<br>• සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46)<br>• නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත |

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| **5. ඇවර කිරීමට හෝ වෙනත් ආයතන සමග ඒකාබද්ධ කිරීමට නියමිත ආයතන**<br><br>i. විදුලි සංදේශ දෙපාර්තමේන්තුව<br>ii. වනජීවී භාරය<br>iii. ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය<br>iv. අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව<br>v. මාශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය<br>vi. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්<br>vii. දරුවන් සුරකිමු ජාතික භාර අරමුදල | • ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (1937 අංක 07)<br>• ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත (2005 අංක 28)<br>• මුදල් ව්‍යාපාර පනත (2011 අංක 42)<br>• විදේශ විනිමය පනත (2017 අංක 12)<br>• රක්ෂණ සංස්ථා පනත (1961 අංක 02)<br>• ශ්‍රම වාසනා අරමුදල් පනත (1998 අංක 12)<br>• තේ ශක්ති අරමුදල පනත (2000 අංක 47)<br>• කප්රුක අරමුදල් පනත (2005 අංක 31)<br>• දේශීය ණය සහ සංවර්ධන අරමුදල පනත (1916 අංක 22)<br>• තුරුසවිය අරමුදල් පනත (2000 අංක 23)<br>• ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනත (1990 අංක 18)<br>• දෘෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය භාර අරමුදල පනත (1992 අංක 9) |

(3) එම නිවේදනයෙහි අංක "6.1 මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂය යටතේ වන "03. අදාළ ආයතනික හා නෛතික රාමුව" පහත පරිදි;

**03. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව<br>2. ජාතික මෙහෙයුම් මැදිරිය<br>3. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව<br>4. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව<br>5. ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීම) පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති ආයතන | • ශ්‍රී ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත (1975 අංක 13)<br>• ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත (2006 අංක 30)<br>• නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත (1997 අංක 7)<br>• ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීම) පනත (2019 අංක 12) |

(4) එම නිවේදනයෙහි අංක "31.0 මහජන ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂයට පසු පහත නව ශීර්ෂය හා ඒ යටතේ වන "01. විෂයපථය, 02. කාර්යයන් හා කර්තව්‍යයන්, 03. සුවිශේෂී ප්‍රමුඛතා සහ 04. අදාළ ආයතනික හා නෛතික රාමුව" ඇතුළත් කිරීමෙන්;

**32.0 සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍ය**

**01. විෂයපථය**

සෞභාග්‍යයේ දැක්ම ජාතික සංවර්ධන වැඩසටහන් තුළ නව අවස්ථා නිර්මාණය කරමින්, සක්‍රීය හා සජීවී යාන්ත්‍රණයක් හරහා ජනතා කේන්ද්‍රීය ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම පිණිස අතිගරු ජනාධිපතිතුමා ගේ නියෝග හා මගපෙන්වීම් මත සියලු සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ව්‍යාපෘති අධීක්ෂණය.

**02. කාර්යයන් හා කර්තව්‍යයන්**

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "සංවර්ධිත රටක්" බිහි කිරීම සඳහා නියමිත නීති සහ අණපනත් වලට අනුකූලව සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. ගම සමග පිළිසඳර වැඩසටහනේ දී ජනතාව විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න හා ගැටළු සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා දෙන උපදෙස් හා නියෝග කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් සියළුම ආයතන ප්‍රධානීන් ද ඇතුළුව, ප්‍රාදේශීය මට්ටමේ සියළුම නිලධාරීන් මෙහෙයවීම.

2. සෑම ගමක්ම ආවරණය වන පරිදි පත්කර ඇති ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය), කෘෂි පර්යේෂණ සහකාර (ගොවිජන සේවා දෙපාර්තමේන්තුව), සමෘද්ධි සංවර්ධන නියාමකවරුන් හා නිලධාරීන් (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව), පවුල් සෞඛ්‍ය නිලධාරීන් (සෞඛ්‍ය දෙපාර්තමේන්තුව), ළමා ආරක්ෂණ ග්‍රාමීය කමිටු, නේවාසික මට්ටමේ ව්‍යාපෘති, තාක්ෂණික හා උපදේශක සේවා සැපයීම සඳහා ඵලදායී ලෙස යෙදවීම.

3. ප්‍රාදේශීය සභා හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුළ 2021-2023 අයවැය රාමුව තුළ රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරන මාර්ග, පානීය ජල සම්පාදන, විදුලිය, දුරකථන සන්නිවේදන, ක්‍රීඩා පිටි, පාසැල්, රෝහල්, වෘත්තීය අධ්‍යාපන ආයතන, නාගරික විශ්වවිද්‍යාල, ඉඩම් පැවරීම්, බැංකු හා මූල්‍ය පහසුකම්, වෙළඳපළ, ගබඩා හා යටිතල පහසුකම් වැනි ව්‍යාපෘති කඩිනම් කිරීම.

4. දේශීය හා විදේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක වන කඩවත - මීරිගම, පොතුහැර - කටුගස්තොට, කුරුණෑගල - දඹුල්ල, කහතුඩුව - ඉංගිරිය - රුවන්පුර, වරාය පිවිසුම් මාර්ග හා අතුරුගිරිය අධිවේගී මාර්ගය, මොරටුව දක්වා වෙරළබඩ මාර්ගය (Marine Drive), සූර්ය බලාගාර (සියඹලාණ්ඩුව), සූර්යබල සහ ජලවිදුලි ද්විත්ව බලාගාර (පුනරීන්), ජලවිදුලි බලාගාර ව්‍යාපෘති (මොරගොල්ල, බ්‍රෝඩ්ලන්ඩ්), කුඹුක්කන් ඔය, මිනිපේ මහ ඇළ, උමා ඔය අවසන් අදියර, උතුරු මැද මහ ඇල, තල්පිටිගල, ගිං නිල්වලා, මාදුරු ඔය දකුණු ඉවුර, වත්තේගෙදර වැව, මුන්දෙනිආරු ජලාශය, වයඹ මහ ඇල, පහල මල්වතු ඔය,අත්තනගල්ල ජලාශය, බස්නාගොඩ ජලාශය, අත්තනගල්ල - මීනුවන්ගොඩ, කුරුණෑගල - මහනුවර, අනුරාධපුරය උතුර, කළු ගඟ ජල සම්පාදන යෝජනා ක්‍රම සහ පොළොන්නරුව හා පහළ ඌව වාරිමාර්ග ව්‍යාපෘති, කොළඹ හා තදාසන්න මැදි ආදායම් නිවාස 50,000 ව්‍යාපෘති, ගාල්ල, කුරුණෑගල, දිගන, නුවරඑළිය, දඹුල්ල තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘති ඇතුළු ව්‍යාපෘතීන් ඉලක්කගත කාලසීමාවන් තුළ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම.

5. සමෘද්ධි හා අඩු ආදායම්ලාභී නේවාසික ඉඩම් වල නිවාස හා සනීපාරක්ෂක කටයුතු, එම භූමිවල එළවළු, පළතුරු, පොල්, කොස්, දෙල් වැනි භෝග වගා කිරීම මගින් නේවාසික ආර්ථිකය ශක්තිමත් කිරීම.

6. ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සඳහා පත්කර ඇති ජනාධිපති අධීක්ෂණ නියෝජිතයන්ට පවරා ඇති සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම.

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* |
|---|
| 1. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.